## බස්නාහිර පළාත් ගුරු සේවයට බඳවා ගැනීමේ ප්‍රායොගික පරීක්ෂණය පිළිබඳ විස්තර

**01.ප්‍රායෝගික පරීක්ෂණය:**

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය.මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | |

**02.ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය:**

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

**03.නිර්ණායකයන්හි අරමුණ:**

**i. අරමුණ හා ප්‍රවිශ්ට වීම.**
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

**ii. පෞරුෂය හා හඬ පාලනය.**
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

**iii. සන්නිවේදනයේ පැහැදිලි බව.**
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාල කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

**iv. කාල කළමනාකරණය.**
ලබා දෙනු ලබන කාල සීමාව තුල අරමුණ කෙරෙහි ලහා වීමේ කුසලතාවය ඇගයීම.

**v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.**
අරමුණ කෙරෙහි ලහා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.